කෑගල්ල නගර සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය.

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 26 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුනි 16 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කෑගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලද පිටිහුමවත්ත ඉඩමෙන් ලද 10% ක බිම් ප්‍රමාණය වූ පර්චස් 67.5 ක ඉඩමේ වටිනාකම වූ රු.15,153,307 ක මුදල ඉඩම් හා ගොඩනැගිලි වටිනාකමට ඇතුළත් නොවීම හේතුවෙන් ස්ථාවර වත්කම් වල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ගණනය කිරීමේදී 2014 අප්‍රේල්, මැයි, ජූලි, අගෝස්තු සඳහා ලැබී තිබූ රු. 4,031,822 ක මුදල උපචිත පදනමින් බැහැරව ගිණුම්ගත කර තිබුණි.

(ඇ) 2014 හා 2015 වර්ෂ සඳහා ලැබිය යුතු රු.49,885 ක උසාවි ගාස්තු සඳහා ණයගැතියන් යටතේ ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි.

(ඈ) 2012, 2013 හා 2014 වර්ෂ සඳහා ලැබී තිබූ රු.29,250 ක උසාවිදඩ මුදල් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ආදායම් විෂයයන් සඳහා සහ වියදම් විෂයන් සඳහා ලෙජර් ගිණුම් පවත්වා නොතිබුණි.

(ඊ) 2015 දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමියෝ රු.48,670,520 ක් ලෙස දක්වා තිබුණද ගෙවීම් ලියවිලි අනුව රු.652,490 ක්වූ ණයහිමියන් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(උ) රංවල ගොවි සංවිධානයේ ණයහිමි ශේෂය රු.380,845 ක් වුවත් ගිණුමේ එය රු.340,845 ක් ලෙස දැක්වීමෙන් රු. 40,000 ක් අඩුවෙන් ණයහිමියන් ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්.
-----------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 05 කට අදාලව මුල්‍ය ප්‍රකාශනවල සඳහන් ශේෂයන්ගේ එකතුව රු. 21,608,932 ක් වූ අතර, උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 20,028,334 ක් වූයෙන් වෙනස රු.1,580,598 ක් විය .

(ආ) මුල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට 19,517,509 ක් ලෙස දැක්වෙන පොදු තැන්පත් ගිණුම වසර ගණනාවක සිටම තුලනය කර නොතිබුණි. මේ නිසා පොදු තැන්පත් ලේඛනය සමඟ ගිණුමේ ශේෂය සැසඳිය නොහැකි විය.

1.3. 3 අවිනිශ්චිත ගිණුම
-----------------------
2015 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය රු.3,657 ක් විය.

1.3.4 ලැබිය යුතු ගිණුම්
--------------------
2015 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලය ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව රු.8,448,456 ක් විය.

1.3.5 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.
---------------------------------------------
පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු. රෙ. 396 (ඇ) | මාස 06 ක් තුළ ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන ලද වටිනාකම රු. 32,746 ක් වූ චෙක්පත් 16 ක් ආදායමට බැරකර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වැනි පරිච්ඡේදයේ 1.6 ඡේදය | ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකුගෙන් අයවීමට තිබූ රු.113,148 ක ණය ශේෂය ස්ථාන මාරු වී ගිය 2011 සැප්තැම්බර් මස සිට අයවීම අත්හිටවී ඇති අතර, මේ වන විට මෙම නිලධාරියා සේවය කරන ආයතනයක තොරතුරු පවා අනාවරණය කරගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.53,037,862 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.38,556,845 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.14,481,017 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 4 ක වැඩිවීම හා වියදම් විෂයයන් 5 ක අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කල ආදායම , තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2015දෙසැම්බර් 31 දිනට හිඟය

| ආදායම් ප්‍රභවය | 2015 ජන 01 දිනටහිඟය රු. | 2015 දෙසැ31 දිනට හිඟයෙන් අයකිරීම රු | 2015 වර්ෂයේ බිල් කිරීම් රු | වර්ෂයේ බිල් කිරීම් වලින් අයවීම රු | 2015ජන 01 දිනට පැවති හිඟයෙන් හිඟ රු | වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය රු | මුළු හිඟය රු |
|---|---|---|---|---|---|---|---|
| | 000 | 000 | 000 | 000 | 000 | 000 | 000 |
| (i) වරිපනම් හා බදු | 5,093 | 2,276 | 8,120 | 6,553 | 2,817 | 1,567 | 4,384 |
| (ii) බදු කුලී | 3,415 | 5,991 | 39,444 | 38,191 | (2,576) | 1,253 | (1,323) |
| (ii) බලපත්‍ර ගාස්තු | 185 | 122 | 2,019 | 1,878 | 63 | 141 | 204 |
| (iv) වෙනත්ආදායම් | 40,772 | 40,461 | 97,001 | 70,117 | 311 | 26,884 | 27,195 |

2.3.2 <u>බදුකුලී</u>

වාර්ෂික බදු පදනම මත සහා දේපල බදු දී ඇති බදුකරුවන් 08 දෙනෙකුගෙන් රු. 16,750 ක හිඟ බදු මුදලක් වසර 1-5 දක්වා කාලයක් අයකරගෙන නොතිබුණි.

2.3.3 <u>දැන්වීම්පුවරු ප්‍රදර්ශන ගාස්තු</u>

හෝරා ස්ථම්භ දැන්වීම්පුවරු ප්‍රදර්ශන ගාස්තු වශයෙන් 2014 හා 2015 වර්ෂයන්ට අදාලව රු.43,890 ක මුදලක් පුද්ගලික සමාගමකින් මඟින් අයකරගෙන නොතිබුණි.

2.3.4 වරිපනම් බදු

(i) වසර 10 කට වැඩිකාලයක සිට අයනොවූ රු.479,321 ක වරිපනම් බදු අයකර ගැනීමට නීත්‍යානුකූල පියවර ගෙන නොතිබුණි.

(ii) වාර්ෂික වරිපනම් ගාස්තු අයකිරීම සඳහා වර්ෂ 05 කට වරක් දේපල තක්සේරු කර අයකිරීම් කළයුතු වුවද 2001 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අය කිරීම් කර තිබුණි.

2.3.5 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

සභා බල ප්‍රදේශයේ දුරකථන සම්ප්‍රේෂණ කුළුනු ඉදිකර ව්‍යාපාර කටයුතු කරගෙන යනු ලබන සම්ප්‍රේෂණ ආයතන 06 කින් රු. 18,000 ක ව්‍යාපාර බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.6 වෙළඳ බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශයේ 2015 වර්ෂයේදී පවත්වාගෙන යනු ලැබූ වෙළඳ ආයතන 11කින් රු.11,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.7 ඉඩම් කට්ටිකර විකිණීම

2005 ජුනි 01 දින අංක 2005/04 දරන සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ iii, iv, v ඡේද ප්‍රකාරව ඉඩම් කොටස් වල තාවකාලික තක්සේරුවක් මත 1% තැන්පතුවක් ලබා ගැනීමටත් , ඉන්පසු විකුණනු ලබන ඉඩම් කොටස් වල විකුණුම් මිල,ඔප්පු අංකය යනාදි විස්තර ඇතුළත් වූ වාර්තාවක් සමඟ විකුණනු ලබන ඉඩම් වටිනාකමට අදාල 1% බදු මුදල ඉඩම් කොටස් විකුණනවාත් සමඟම විකුණුම්කරු විසින් සභාවට ගෙවන බවට කොන්දේසි ඇතුළත් ගිවිසුමකට එළඹීම හා එම 1% ක බදු මුදල දින 14 ක් ඇතුළත අයකර ගැනීමට හා එම බදු මුදල නොගෙවුව හොත් අධිකරණය වෙත වාර්තා කර අයකිරීම් කර ගැනීමටත් කටයුතු කළ යුතු බව දක්වා තිබුණි. 2014 වර්ෂයේදී ඉඩම් කට්ටිකර විකුණන ලද පිටිහුමවත්ත නැමති ඉඩමේ බිම් කොටස් වල ඔප්පු පරීක්ෂාකර විකුණුම් මිලට අනුව 1% ක ගාස්තු අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි.

2.3.8 නීතිඥ කාර්යාල සඳහා ව්‍යාපාර බදු අය නොකිරීම

නගර සභා ආඥා පනතේ 165 (අ) සහ (ආ) හි සඳහන් පරිදි නගරසභා සීමාව තුළ කරගෙන යන කර්මාන්තයන් හෝ වෘත්තීන් වෙනුවෙන් බලපත්‍රයක් ලබාදිය යුතු වුවද කෑගල්ල නගර සීමාවේ නගර සභා නීතිඥ කාර්යාල සංකීර්ණයේ පවත්වාගෙන යන නිතිඥ කාර්යාල 22 න් හා නගරයේ අනෙකුත් නීතිඥ කාර්යාල වලින් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.9 නීතිඥ කාර්යාල සංකීර්ණයේ කුලී අය නොකිරීම

කෑගල්ල නගර සභා නීතිඥ කාර්යාල සංකීර්ණයේ රු.1,000 ක මාසික කුලිය මත පවත්වාගෙන යන අංක 20 කාමරයට අදාලව හිඟ කුලී රු.35,000 ක් හා දඩ රු.52,500ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.10 ප්‍රචාරක දැන්වීම් පුවරු

-------------------------

(i) නගර සභා බල ප්‍රදේශය තුළ 2015 වර්ෂය සඳහා ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරු 34 ක් සඳහා රු.675,582 ක මුදලක් අයකර තිබුණ අතර 2016 පෙබරවාරි 29 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවට අනුව ප්‍රචාරක දැන්වීම් පුවරු 37 ක් සඳහා ගාස්තු අය නොකිරීම නිසා රු.372,400 ක ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

(ii) සභා බල ප්‍රදේශය තුල ඇති ඩිජිටල් නාම පුවරු මත ගාස්තු අයකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන නොමැති අතර නියැදි විගණන පරික්ෂාව අනුව සභා බල ප්‍රදේශය තුල ඩිජිටල් දැන්වීම් පුවරු 100 කට වැඩි ප්‍රමාණයක් ඇති බව නිරීක්ෂණය විය.ඒ සඳහා ගාස්තු අයකර නොතිබුණි.

2.3.11 නගර සභාව සතු දේපල බදු දීම

කැගල්ල නගර සභාව සතු ඉඩම් තාවකාලික බෝග වගා කිරීමේ පදනම මත වාර්ෂික බදු ගිවිසුම් අත්සන් කොට බදු දී තිබුණි. බිම් කොටස් බදු දීමේදී සභාව විසින් භාවිතා කරනු ලබන බදු ගිවිසුමේ 06 වන වගන්තිය අනුව බදු දෙන ඉඩම් කොටස තුළ බදු කරු විසින් ස්ථිර ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ ස්ථිර වගාවක් කිරීම තහනම් බවත් එම කොන්දේසි කඩකරමින් බදුකරු ක්‍රියාකර ඇත්නම් බදු කාල සීමාව අවසානයේ එම ගොඩනැගිල්ල හෝ ස්ථිර වගාව කිසිදු වන්දියක් නොගෙවා නගර සභාවට ඵලදායි කාර්යයක් සඳහා යොදා ගැනීමට හැකි බවත් සඳහන් කර ඇත. එම ගොඩනැගිල්ල හෝ වගාව නගර සභාව මඟින් ඵලදායී කාර්යයකට යොදා ගනු නොලබන්නේ නම් වාර්ෂික බදු ගිවිසුම මඟින් බදු දීමට ක්‍රියාකළ යුතු වේ. සභා ඉඩම් කොටස් 51 කට අදාලව බදු පදනම මත ලබාගත් බදුකරුවන් ස්ථිර ගොඩනැගිලි ඉදිකර ඇතත් ඒ පිළිබඳව ක්ෂේත්‍ර නිලධාරින් සභාවට වාර්තා කර නොතිබුණි. එම බිම් කොටස් 51 ට අදාල ගොඩනැගිලි ඉදිකිරීම් සම්බන්ධයෙන් බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබූ බවත් බිම් කොටස් නැවත තක්සේරු කර කුලී අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් ගේ 2011 ජූලි 20 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 02 / 2011 (සංශෝධන) මගින් පළාත් පාලන ආයතන විසින් බඳවාගනු ලබන අනියම්, තාවකාලික , ආදේශක වැනි දෛනික වැටුප් ලබන සියළුම සේවකයින් රාජ්‍ය සේවක අර්ථ සාධක අරමුදලට දායකකර පත්වීම් ප්‍රදානය කළයුතු බවට අවධාරණය කර තිබුණද 2014 වර්ෂයේදී සේවයට බඳවා ගන්නා ලද සේවකයින් 28 ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කර ගැනීමෙන් 2015 වර්ෂය තුළ පමණක් රු. 67,865 ක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවා තිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට විශ්‍රාම ගිය සහ ස්ථාන මාරුවීම් ලබා ගිය සේවකයින් 04 දෙනෙකුට අදාලව ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ පවත්වාගෙන යන වටිනාකම රු.10,080 ක් වූ සේවක ඇප තැන්පතු නිදහස් කර නොතිබුණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් විසින් ලබාදෙන ලද වාහන 14 ක්, පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් විසින් ලබාදෙන ලද එක් වාහනයක් හා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලබාදෙන ලද එක් වාහනයක් වශයෙන් වූ වාහන 16 ක අයිතිය නගර සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 පෙබරවාරි 16 දින සභාවේ ගබඩාව භාර කළමනාකරණ සහකාරවරයා සමග සිදුකරන ලද ගබඩා පරීක්ෂාවේදී අයිතම් තුනක වටිනාකම රු.396,861 ක තොග ඌනතාවයක් නිරීක්ෂණය විය.

(ඇ) වැඩ ක්ෂේත්‍ර කම්කරු සහ සෞඛ්‍ය කම්කරු තනතුරු පිළිවෙලින් 19 ක් හා 07 ක් වශයෙන් පුරුප්පාඩු පැවතීම හේතුවෙන් සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් සැපයීම අවම මට්ටමේ පැවතුනි. මාර්ග නඩත්තු කටයුතු සඳහා ප්‍රමාණවත් වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් බඳවා නොගැනීම හේතුවෙන් මාර්ග අළුත්වැඩියා කටයුතු හා නඩත්තු කටයුතු නිසි පරිදි සිදු නොවී පැවති අතර

සභාවේ මාර්ග පිරිසිදු කිරීම, කාණු පද්ධති පිරිසිදු කිරීම, කැලි කසල ඉවත් කිරීම, වැසිකිළි පිරිසිදු කිරීම හා කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදි සිදු නොවන බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඈ) ප්‍රමාණවත් සෞඛ්‍ය කම්කරුවන් නොමැති වීම හේතුවෙන් රෝහල් වට රවුම අසල පිහිටි වැලිමන්නා තොට වැසිකිළිය වසා දමා තිබූ අතර නව ආර්ථික මධ්‍යස්ථානය සඳහා ඉදිකර තිබූ කාන්තා හා පිරිමි වැසිකිළිය පොදු භාවිතයට වෙන් නොකර වෙළඳ ව්‍යාපාරිකයින්ගේ භාවිතය සඳහා පමණක් වෙන්කර තිබුණි. (ව්‍යාපාරිකයන් වෙත යතුරු භාරදී තිබූ අතර පාවිච්චියෙන් පසු ඉබියතුරු දමා වසා තැබීම) සභාවට අයත් තවත් වැසිකිලි 05 ක් පිරිසිදු කිරීම සඳහා එක් සෞඛ්‍ය කම්කරුවෙකු පමණක් සේවයේ යොදවා සිටි බැවින් ඒවායේ පිරිසිදුතාවය පහළ මට්ටමක පැවතුණි.

3.3 අවිධිමත් ගනුදෙනු
-----------------------

පළාත් පාලන ආයතන වලට අනුයුක්තව සේවය කරනු ලබන ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා දුරකථන දීමනාව ලෙස 2015 ජනවාරි මස සිට රු.2,500 ක මුදලක් මාසිකව වැටුපට එකතුකර ගෙවීම් කර තිබියදී රු.3,505 ක බිල්පත් ද ප්‍රතිපූරණය කර තිබුණි.

3.4 කොන්ත්‍රාත් පරිපාලනය
-----------------------------

2016 පෙබරවාරි 29 දින පෙර නිමිතාර මිශ්‍රණ යොදා අලුත්වැඩියා කරන ලද කෑගල්ල තටාක පාර තුන්වන පටුමග කර්මාන්තය, සභාවේ වැඩ අධිකාරිවරයා සමඟ 2016 මාර්තු 01 දින ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක් කිරීමේදී මාර්ග තලයේ පලුදු වූ ස්ථාන පිරිසිදු කිරීමකින් හා එකී ස්ථාන වලට උණු තාර ආලේප කිරීමකින් තොරව පූර්ව මිශ්‍රණ දමා තිබූ බව නිරීක්ෂණය විය. පූර්ව මිශ්‍රණ යෙදීමෙන් පසුව ලෙලෙන තලනයක් මඟින් තැලීම සිදු කර නොතිබුණි.

4. පද්ධති හා පාලන.
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) තොග පාලනය
(ඊ) ණයගැති පාලනය